ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2015

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

---

## A - කොටස

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මුළු විෂය නිර්දේශයම ආවරණය වන පරිදි සකස් කරන ලද උප ප්‍රශ්න 18 කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් කිහිප දෙනෙකු හැර අනෙකුත් සියළුම දෙනා පිළිතුරු සපයා තිබූ අතර ඉන් සියයට 50 කට වැඩි ප්‍රමාණයකට වෙන්කල මුළු ලකුණුවලින් අඩකට වඩා ලබා ගැනීමට හැකිවී තිබුණි. එසේ වුවද ඇතැම් අයදුම්කරුවන් සපයන ලද පිළිතුරු අනුව ගිණුම්කරණයේ මූලිකාංග සම්බන්ධයෙන් ඔවුන්ට ඇති දැනුම ඉතාමත් අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරු ඇගයීමේදී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස පිළිබඳ බොහෝ දෙනෙකුට අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය. මේ නිසා 1.2 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණි.

(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරනු ලබන්නේ අස්ථිත්වයක යම් නිශ්චිත දිනකට මූල්‍ය තත්ත්වය නියෝජනය කිරීමට යන්න තේරුම් නොගත් අයදුම්කරුවන් විසින් ඒ සඳහා වැරදි පිළිතුරු තෝරාගෙන තිබුණි.

(3) අංක 1.10 හා 1.11 යන ප්‍රශ්නයන්හි දී තිබූ ප්‍රකාශ, "සත්‍ය" හෝ "අසත්‍ය" යන්න දැක්වීමේදී බොහෝ දෙනෙකු එම ප්‍රකාශයන් නිසි පරිදි අවබෝධ කර නොගෙන පිළිතුරු සපයා ඇති බව නිරීක්ෂණය වූ අතර 1.11 හි දක්වා තිබූ ප්‍රකාශය බොහෝ දෙනෙකු අසත්‍ය යනුවෙන් දක්වා තිබුණි.

(4) මූර්ත ගිණුම්, පුද්ගලික ගිණුම් හා නාමික ගිණුම් යන්න නිවැරදිව හඳුනා ගැනීමට අයදුම්කරුවන්ගෙන් බොහෝ පිරිසකට නිසි අවබෝධයක් නොවූ බව නිරීක්ෂණය විය.

(5) 1.14 ප්‍රශ්නයට අදාළ ගිණුම්කරණ සංකල්පයන් නිවැරදිව හඳුනාගැනීමට බොහෝ දෙනෙකු අපොහොසත්වී තිබූ අතර නිවැරදි පිළිතුරු ලබාදී තිබුණේ අයදුම්කරුවන්ගෙන් සියයට 10 ක පමණ ප්‍රමාණයක් පමණි. ගිණුම්කරණ සංකල්ප පිළිබඳ අයදුම්කරුවන් තුල ඇති අල්ප දැනුම මෙම ප්‍රශ්නයට ලබා දී තිබූ වැරදි පිළිතුරු වලින් මනාව පැහැදිලි විය.

(6) ඇතැම් අයදුම්කරුවන්ට අවබෝධය නොමැතිකම නිසා දී ඇති වියදම් ප්‍රාග්ධන වියදම් හා අයභාර වියදම් ලෙස නිසි පරිදි වර්ගීකරණය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(7) අයදුම්කරුවන්ගෙන් බහුතරයකට සුළු මුදල් අග්‍රිමය යන්න පිළිබඳ නිසි අවබෝධයක් නොවූ බැවින් 1.17 ප්‍රශ්නයට අදාළ ප්‍රතිපූර්ණය වශයෙන් ලැබිය යුතු මුදල නිවැරදිව ගණනය කළ නොහැකි වී තිබුණි. 1.8 ප්‍රශ්නයට පිළිතුර ලෙස පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මක ලක්ෂණ නිවැරදිව දක්වා තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් අඩු ප්‍රමාණයක් බැවින් ඒ සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අවම මට්ටමක පවතින බව ගම්‍ය වේ.

(9) ඇතැම් අයදුම්කරුවන් මෙම පළමුවන ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති උපදෙස් නිසි පරිදි කියවා නොබැලීම නිසා නිවැරදි පිළිතුර පිළිතුරු පත්‍රයේ නොලියා ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයා ඇති අවස්ථා නිරීක්ෂණය වූ අතර ඇතැම් අයදුම්කරුවන් පිළිතුරට අදාළ අංකය සඳහන් කරනවා වෙනුවට පිළිතුර සම්පූර්ණයෙන්ම ලියා තිබූ අවස්ථා ද නිරීක්ෂණය විය. මේ නිසා අයදුම්කරුවන් අනවශ්‍ය කාලයක් වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 08**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ව්‍යාපාරයක පවතින සම්පත් හා එම සම්පත් සපයන පාර්ශවයන්ට ව්‍යාපාරයට ඇති බැඳීම පිළිබඳ සම්බන්ධතාවය පෙන්නුම් කරනු ලබන ගිණුම්කරණ සමීකරණය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා සෑම අයදුම්කරුවෙකුම පිළිතුරු සැපයීමට උත්සාහ ගෙන තිබුණ ද බොහෝ දෙනෙකුට වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත්වී තිබුණි. පිළිතුරු පත් ඇගයීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) ඇතැම් අයදුම්කරුවන් විසින් පළමු ගනුදෙනුවේ ඇතුලත්, සනත් විසින් ජංගම ගිණුමේ තැන්පත් කරන ලද මුදලින් රු.250,000 ක් වටිනා තොග මිලදී ගත්බව තේරුම් නොගෙන එය සනත් විසින් ගෙන එන ලද තොගයක් ලෙස සලකා ප්‍රාග්ධනයට ගලපා තිබුණි.

(2) ප්‍රශ්නය අවසානයේ දක්වා ඇති සමීකරණයේ ආදායම් හා වියදම් තීරුවක් දක්වා තිබියදීත් ඒ පිළිබඳව නොසලකා ආදායම් හා වියදම් ප්‍රාග්ධනයට ගලපා තිබුණි.

(3) අගයන් දැක්වීමේදී සම්පූර්ණ අගයම හෝ දහස් ගණනින් යන දෙකින් එක් ආකාරයකට පමණක් දැක්විය යුතු වුවත් ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයේ එක් එක් ගනුදෙනු මෙම දෙආකාරයටම සටහන් කර තිබුණි.

(4) විකුණු භාණ්ඩවල පිරිවැය ගණනය කිරීම නිවැරදිව සිදු නොකිරීම.

(5) ඇතැම් අයදුම්කරුවන්ට ගිණුම්කරණ සමීකරණය යනු කුමක්ද යන්න පිළිබඳව පවා නිවැරදි අවබෝධයක් නොතිබීම හේතුවෙන් ශේෂ පිරික්සුම පවා පිළියෙල කිරීමට පෙළඹී තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 08**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ශේෂ පිරික්සුමක් සමාන නොවීම නිසා වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන්කර ඇති අවස්ථාවක පසුව එම වැරදි නිවැරදිකර අවිනිශ්චිත ගිණුම පියවන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය නිර්මාණයකර තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට ද සමත්වී තිබුණි. එසේ වුවද ඇතැම් අයදුම්කරුවන් අඩු ලකුණු ලබාගෙන තිබූ අතර එයට පහත සඳහන් පොදු අඩුපාඩු බලපා තිබුණි.

(1) වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුම තුලනය වී යන බව ඇතැම් අයදුම්කරුවන් අවබෝධ කරගෙන නොතිබීම නිසා අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඉදිරියට ගෙනගොස් තිබූ අවස්ථා ද දක්නට ලැබුණි.

(2) වෙනත් ආදායමක් වෙනත් වියදමක් ලෙස දැක්වීම නිවැරදි කිරීමේ ජර්නල් සටහන බොහෝ දෙනකුට නිවැරදිව දැක්වීමට නොහැකිවී තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් සහ ශේෂ පිරික්සුම පවා දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 8**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ද්විත්ව සටහන් ක්‍රමය හා ගිණුම් තැබීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකස්කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණු අතර බොහෝ දෙනෙකුට වෙන්කළ ලකුණු වලින් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාව ලැබී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේදී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) ඇතැම් අයදුම්කරුවන් නිවැරදිව ශේෂ පිරික්සුම පිළියෙල කිරීමට අපොහොසත්වී තිබුණි.

(2) බොහෝ අයදුම්කරුවන් අනෙකුත් ලෙජර් ගිණුම් නිවැරදිව පිළියෙල කර තිබුණ ද ද්විත්ව තීරු මුදල් පොත නිවැරදිව පිළියෙල කිරීමට අපොහොසත්වී තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන්ට ද්විත්ව සටහන් මූලධර්මය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය.

(4) ප්‍රශ්නයේ පැහැදිලිව පොදු ලෙජරය පිළියෙල කරන ලෙස දක්වා තිබියදීත් ඇතැම් අයදුම්කරුවන් එය නිසිලෙස කියවා තේරුම් නොගැනීම නිසා ලෙජර් ගිණුම් වෙනුවට ජර්නල් සටහන් පිළියෙල කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(5) ඇතැම් අයදුම්කරුවන් පොදු ලෙජරය පිළියෙල නොකර ශේෂ පිරික්සුම පමණක් පිළියෙල කළ අවස්ථා ද නිරීක්ෂණය විය. නමුත් එම අයදුම්කරුවන්ට ද අදාල පරිදි ලකුණු වෙන් කරන ලදී.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 08**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

වත්කමක ප්‍රාග්ධනිත කළයුතු පිරිවැය, ක්ෂය කළ හැකි වටිනාකම, වාර්ෂිකව ක්ෂය කළයුතු අගය හා ඒ සම්බන්ධ ලෙජර් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය පිළියෙල කර තිබූ අතර බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොතිබුණි. පිළිතුරු සපයා තිබූ අයදුම්කරුවන් ද අවම ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබූ අතර මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) යන්ත්‍රයේ ප්‍රාග්ධනිත වටිනාකම ගණනය කිරීමේදී ගැනුම් මිලෙහි ඇතුළත් නැවත අයකරගත හැකි එකතු කල අගය මත බද්ද ගැනුම් මිලෙන් අඩුකර ගණනය කිරීම බොහෝ දෙනෙකු සිදුකර නොතිබුණි.

(2) වත්කමක් ප්‍රාග්ධනිත කිරීමේදී එම වත්කම පාවිච්චියට සුදුසු තත්ත්වයට පත්කිරීම දක්වා සියළුම වියදම් එයට අදාළ කර ගත යුතුය යන්න පිළිබඳව බොහෝ අයදුම්කරුවන්ට අවබෝධයක් නොමැති බව ඔවුන් සපයා ඇති පිළිතුරු වලින් නිරීක්ෂණය විය.

(3) යන්ත්‍රයේ ක්ෂය කළහැකි වටිනාකම ගණනය කිරීමේදී ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා දැරීමට සිදුවන පිරිවැය අඩු කළයුතු බවට බොහෝ දෙනෙකුට අවබෝධයක් නොතිබූ බැවින් ක්ෂයකළ හැකි වටිනාකම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත්වී තිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 14**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය කේවල ස්වාමි ව්‍යාපාරයක අවසන් ගිණුම් පිළියෙල කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සරල ගැලපුම් කීපයක් ඇතුළත් කර සකස් කරන ලද්දකි. කිහිප දෙනෙකු හැර සෑම අයදුම්කරුවකුම මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහකර තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් සම්පූර්ණ ප්‍රශ්නයටත් ඇතැම් අය විවිධ කොටස්වලට පමණක් පිළිතුරු සපයා තිබුණි. කෙසේ වෙතත් බොහෝ අයදුම්කරුවන්ට වෙන්කළ ලකුණුවලින් වැඩි ප්‍රමාණයක් ලබාගත හැකිව තිබුණි. එහෙත් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) තොග ගැලපීමේදී පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුවත් බොහෝ දෙනෙකු ශුද්ධ උපලබ්ධි අගය (වැඩි අගය) තොගයේ අගය ලෙස හඳුනා එය ගලපා තිබුණි.

(2) ඇතැම් අයදුම්කරුවන් ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව ගණනය කර තිබුණ ද නිවැරදිව ගිණුම්ගත කිරීමට අපොහොසත්වී තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ස්ථාවර තැන්පතු පොලිය ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණ ද ඒවා ලැබිය යුතු පොලී ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(3) බොහෝ දෙනෙකුට අඩමාන ණය වෙන්කිරීම නිවැරදිව ගිණුම්ගත කිරීමට අපොහොසත්වී තිබුණි. මෙහිදී අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රමාණය වැඩිකිරීම නිවැරදිව හඳුනාගෙන නොතිබූ අතර එම වැඩිවීම පමණක් ඌන වෙන් කිරීමක් ලෙස ගිණුම්වල දැක්වියයුතු බවට අවබෝධ කරගෙන නොතිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් ස්ථාවර තැන්පත් ශේෂය, ගිණුම්වල දැක්වීමේදී ප්‍රාග්ධන කොටස දිගුකාලීන වගකීම් ලෙසත්, පොළී ආදායම ආදායම් ලෙසත්, ලැබියයුතු පොළිය ජංගම වගකීමක් ලෙසත්, දක්වා තිබුණි.

(5) බැංකු අයිරාව ජංගම වගකීමක් වුවත් එය ජංගම වත්කම් යටතේ දක්වා තිබූ අවස්ථා ද නිරීක්ෂණය විය.

(6) සුළු පිරිසක් හැර බොහෝ දෙනෙකු පිළිතුර සම්පූර්ණ කර නොතිබුණි. ඇතැම් අය පිළිතුරේ කොටස් පමණක් සම්පූර්ණකර තිබූ අතර ඇතැම් අය අදාළ අයිතමයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර තිබූ අතර අවසන් ප්‍රතිඵලය ගණනය කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 14**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය අයදුම්කරුවන්ගේ නිෂ්පාදන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා පිළියෙල කරන ලද්දකි. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වූ අතර පළමු කොටසින් නිෂ්පාදන ගිණුම පිළියෙල කර මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමත් දෙවන කොටසින් 25% ක ලාභාන්තිකයක් තබාගෙන ලකුණු කළ මිලකට විකුණුම් අංශය වෙත මාරු කරන වටිනාකම ගණනය කිරීමත් පරීක්ෂාකර තිබුණි.

සෑහෙන අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා වෙන්කරතිබූ ලකුණුවලින් වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වුවද සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොතිබුණි.

සමස්තයක් ලෙස ගත්කල අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේදී ඉතාමත් සාර්ථක නොවීය. අයදුම්කරුවන්ගෙන් කීප දෙනෙකු හැර අනෙකුත් කිසිදු අයදුම්කරුවෙකුට මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකිවී තිබුණි.

කෙසේ වුවද මෙම ප්‍රශ්නයේ (a) කොටසට බොහෝ දෙනෙකු සාමාන්‍ය මට්ටමෙන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණ ද මෙම ප්‍රශ්නයේ පිළිතුරු ඇගයීමේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු පහත පරිදි විය.

(1) බොහෝ අයදුම්කරුවන් සෘජු පිරිවැය සහ කම්හල් පොදුකාර්ය පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත්වී තිබුණි.

(2) අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රමාණයකට ප්‍රාථමික පිරිවැය නිවැරදිව ගණනය කිරීමට නොහැකිවීම නිසා ඒ සඳහාවූ ලකුණු අහිමිව ගොස් තිබුණි.

(3) ඇතැම් අයදුම්කරුවන් පෙරවැඩ ඉදිරිපත් නොකර අගයන් සෘජුවම නිෂ්පාදන ගිණුමේ දක්වා තිබීම නිසා එම අගයන් නිවැරදි නොවුනහොත් ගණනය කිරීම් සඳහා වෙන්කරන ලද ලකුණු අහිමිව ගොස් තිබුණි. උදාහරණ වශයෙන් සෘජු ශ්‍රමය, ක්ෂයවීම් ගණනය කිරීම ආදිය දැක්විය හැකිය.

(4) සැළකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයකට කම්හල් කළමණාකරු වැටුප, සභය කාර්ය මණ්ඩලයේ වැටුප් හා කම්හල් ගොඩනැගිල්ලේ ක්ෂයවීම් නිවැරදිව ගණනය කිරීම අපොහොසත්වී තිබුණි.

ඉතාමත් සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් මෙම ප්‍රශ්නයේ (b) කොටසට පිළිතුරු සපයා තිබූ අතර ඉන් බොහෝ දෙනෙකුට ඒ සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත්වීම හේතුවෙන් ආන්තිකයක් තබාගෙන විකුණුම් අංශයට මාරුකිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

- * * * -